# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,436 — 1958 ජූලි 25 වැනි සිකුරාද — 25.7.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)


# III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 989 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් | | ... | 997 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 998 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලයේ " ඒ " කොට්ඨාශයේ මීගමු නගර සභා සීමාව තුල කුඩාපාඩුව පිහිටි ලූවිස් පෙදෙසේ වරිපනම් අංක 154 දරණ ඉඩමෙන් අ. 0, රූ. 0, පා. 12·5ක පමණ ප්‍රමාණය :—

ඊට මායිම—

උතුරට : ඩබ්ලියු. මරියා ප්‍රනාන්දු අයිතිකම් කියන ඉඩම.
නැගෙනහිරට : ඩබ්ලියු. ගේබ්‍රියල් ප්‍රනාන්දු අයිතිකම් කියන ඉඩම.
දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස.
බස්නාහිරට : ලූවිස් පෙදෙස.

අංක : කිව්.බී.296/ජේ57/58ඇල්ජී17.

1958ක්වූ ජූලි මස 14 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නාමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ මාලගල යන ගමේ පිහිටි කුන්කින්දවල කුඹුර සහ හිරිකුඹුර යන ඉඩම්වලින් පාර්චස් 13·9ක් පමණවූ කැබැලි 3ක ප්‍රමාණය :—

(1) කුන්කින්දවල කුඹුර (අ. 0 රූ. 0 පාර්චස් 03·4 ක පමණ ප්‍රමාණය).
උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.
දකුණට : ඇල.
බස්නාහිරට : රතඹගහ ඇල

(2) හිරිකුඹුර (අ. 0 රූ. 0 පාර්චස් 03·3ක පමණ ප්‍රමාණය)
උතුරට : ඇල.
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.
දකුණට : පරණ රතඹගහ ඇල.
බස්නාහිරට : රතඹගහ ඇල.

(3) හිරි කුඹුර (අ. 0 රූ. 0 පාර්චස් 07·2 ක පමණ ප්‍රමාණය)
උතුරට : පරණ රතඹගහ ඇල.
නැගෙනහිරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස.
බස්නාහිරට : රතඹගහ ඇල.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලයේ ගොරොක්ගොඩ යන ගමේ පිහිටි වැළිකුඹුර සහ වැළිකුඹුරේ ඔවිට යන ඉඩම්වලින් අ. 0 රූ. 0 පාර්චස් 31·7ක පමණවූ කැබැලි 3ක ප්‍රමාණය :—

(1) වැළිකුඹුර : (අ. 0 රූ. 0 පාර්චස් 06·8ක පමණ)
උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස.
නැගෙනහිරට : රතඹගහ ඇල.
දකුණට : ඇල.
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩී. ඊ. වික්‍රමසිංහ සහ තවත් අයට අයිති වැළිකුඹුර යන ඉඩමේ කොටසක්.

(2) වැළිකුඹුරේඔවිට (අ. 0 රූ. 0 පාර්චස් 21·3 ක පමණ)
උතුරට : ඇල.
නැගෙනහිරට : රතඹගහ ඇල.
දකුණට : ආර්. ඒ. දෙන් උදේනිස් අප්පුහාමි සහ තවත් අයට අයිති වැළිකුඹුර යන ඉඩම.
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

(3) වැළිකුඹුර (අ. 0 රූ. 0 පාර්චස් 03·6 ක පමණ)
උතුරට : එච් දෙන් හරමානිස් සහ තවත් අයට අයිති වැළිකුඹුරේඔවිට යන ඉඩම.
නැගෙනහිරට : රතඹගහ ඇල.
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

අංක : කිච්.බී.229/ජේ56ඇල්184.

1958ක්වූ මැයි මස 21 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : J 57/58 F 515 ; R/Q 222.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිසාවේ, කොළඹ නාගරික සීමාවතුල අංක 13 කොට්ඨාශය වන කොටුවේ පිහිටි කුමාර වීථියේ වරිපනම් අංක 21–25 දරණ පාර්චස් 42ක් පමණ විශාලවූ සීමා සහිත වයිට්එවේ ලේඩ්ලෝ සහ සමාගමේ මහතුන්ට අයත් වෙළඳ ගොඩනැගිලි සහිත ඉඩමට මායිම් :—

උතුරට : අලුත් මහලේකම් කායාිලයීය ගොඩනැගිලි (රජය).
නැගෙනහිරට : කුමාරවීථියේ වරිපනම් අංක 33–37 දරණ කොළඹ ඇපොතිකරීස් සමාගමට අයත් ගොඩනැගිලි.
දකුණට : කුමාර වීථිය.
බස්නාහිරට : කුමාරවීථියේ වරිපනම් අංක 13–15 දරණ ලොයිඩ්ස් ගොඩනැගිල්ල.

1958ක්වූ ජූලි මස 21 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපණතෙන් සංශොධනය කරන පරිදි 1950 හේ අංක 9දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල්ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

(1) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වැවගම් පත්තුවේ, මඩවල්ලන්ද ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 5යි, රූඩ් 1යි, පර්චස් 08ක් පමණ ඇති මෙරවලන්ද මලයඩිකන්දම් යන ඉඩම් කැබලි 3ක්. ඊට මායිම්—සියලුම පැත්තෙන් ගල්ඔය සංවර්ධන මණ්ඩලේට අයත් ආණ්ඩුවේ ඉඩම්.

(2) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වැවගම් පත්තුවේ, මඩවල්ලන්ද ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 15යි, රූඩ් 1යි, පර්චස් 32ක් පමණ ඇති මෙරවලන්ද මලයඩිකන්දම්, කුලාඩිවට්ටෙයි, මලයඩිකන්දම් හා කච්චිකුඩි මලයඩි කන්දම් යන ඉඩම් කැබලි 3ක්. ඊට මායිම්—ගල්ඔය සංවර්ධන මණ්ඩලේට අයත් ආණ්ඩුවේ ඉඩම්.

මඩකලපු කච්චේරියේ අංක ඇල්.ඩී. 3762.
මන්ත්‍රී කායා්ලයේ අංක ජේ 57/58 ඇල් 25.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1958ක්වූ ජූනි මස 16 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරනු ලැබූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි.

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ සංශෝධික ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පසිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කරවාකු හා නිද්වූර් පත්තුවේ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ, නයිපිද්දි ගමේ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් 3යි, පර්චස් 14ක් ඇති තාලෙයියඩිවලවූ, පල්ලියඩිවලවූ, ඉල්ලුම්වෙපියඩිවලවූ හා මුස්ලිම් පල්ලි යන ඉඩමෙන් කොටහක්. ඊට මායිම් :—

නැගෙනහිරට : පාර ;
දකුණට : පෙරියපල්ලිවාසල් මුස්ලිම් පල්ලි ;
බස්නාහිරට : පාර ;
උතුරට : ඇම්. කුලන්තෙයිඋම්මා, ඒ. මුත්තුම්මා හා වී. වී. ඇම්. යාසිම්ලෙබ්බෙ යන ඇත්තන් අයිතිය කියන ඉඩම.

මඩකලපු කච්චේරියේ අංක ඇල්.ඩී. 3750.
මන්ත්‍රී කායා්ලයේ අංක ජේ.57 ඊ.501.

1958ක්වූ මැයි මස 31 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය. 3/62/4/57/58.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට-ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ (සංශෝධිත) පණතෙන් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ දෙඩම්පොත්ත පළාතේ කෝඳුරුවාවෙල නමැති ගමේ පිහිටි කඩේවත්ත (නො. 387 දරණ අවසාන ගම් මැනීමේ සැලැස්මේ කැබැලි නො. 32න් කොටසක්) නමැති ඉඩමෙන් අඩි 132ක් දිග සහ අඩි 12ක් පමණ පළල ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් තීරය :—

උතුරට සහ නැගෙනහිරට : එච්. කේ. ඇම්. මල්ලියා විසින් අයිති කම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : කොඳුරුවාවෙල–දළුපොතවත්ත පාර ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

අංකය. ජේ57 ඇල්ජී 137.

වර්ෂ 1958ක්වූ ජූනි මස 6 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : 3/62/4/57/66.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ (සංශෝධිත) පණතෙන් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ කොල්ලුරේ පළාතේ, දෙනගමුව නමැති ගමේ පිහිටි බුලුගහකනත්ත නමැති ඉඩමෙන් අක්කර 2ක පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : පොඩිනෝනා විසින් අයිතිකම් කියන ඉඩම ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : දෙනගමුව–කොල්ලුරේ ගම්සභා පාර ;
බස්නාහිරට : කුඹුරු.

අංකය : ජේ 57 ඇල්ජී 305.
වර්ෂ 1958 ක්වූ ජූනි මස 20 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරණ ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නාබවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හුරුළු පළාතේ ආදයම් පාළක කොට්ඨාශයට අයත්, කුංචුට්ටු කෝරළයේ පිහිටි වත්තේ වැව නමැති ගමේ නුගගහ ඉඩම (ටී.පී.365703) අක්. 1 රූඩ් 2. පර්චස් 01 ක් පමණවූ ප්‍රමාණය දැක්වෙන බිම් කැබැල්ලට මායිම් මෙසේය :—

උතුරට : පී.පී. 6060 ලොට් 4න් කොටසක් ;
නැගෙනහිරට : නුගගහඉඩම රාජසන්තක කැලය ;
දකුණට : ටී.පී. 405209 සහ එම ඉඩමේ කොටසක් ;
බස්නාහිරට : පී.පී. 6668 ලොට් 1 න් කොටසක්.

අංකය. ජේ.56 ඇල් 297

1958.4.23 වෙනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමැති තුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධික) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාත ආදයම් පාලක කොට්ඨාශයට අයත්, අළුතම්ල්ලෑව ගමේ පිහිටි අක්කර ඉඩම, අළුගහවත්ත, සහ කොස්ගහ වත්ත යයි කියනු ලබන අක්. 0, රූඩ් 0, පර්. 39 කින් පමණවූ බිම් කැබැලි වලට මායිම් මෙසේය :

(1) බදු ඉඩම.—පර්චස් 5ක් පමණ :
උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
නැගෙණහිරට : රාජසන්තක ඉඩම් ;
දකුණට : අළුත් පාර (රාජසන්තක).

(2) අක්කර ඉඩම.—පර්චස් 18කින් පමණ :
උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
නැගෙනහිරට : යූ. නයිදුරාල හිමිකම් කියන ඉඩම ;
දකුණට : අළුත් පාර (රාජසන්තක).

(3) අඹගහවත්ත.—පර්චස් 2.5 :
උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේ කොටස් ;
නැගෙණහිරට : අළුත් පාර. (රාජසන්තක ඉඩම්) ;
දකුණට : වැන්කියට යන අඩිපාර (රාජසන්තක).

(4) කොස්ගහවත්ත.—පර්. 6 ක් පමණ :
උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
නැගෙනහිරට සහ දකුණට : අළුත්පාර (රාජසන්තක).

(5) කොස්ගහවත්ත.—පර්. 2.5 ක් පමණ :
උතුරට සහ බස්නාහිරට : (රාජසන්තක) (අළුත් පාර) ;
දකුණට : යූ. කන්දතේ හිමිකම් කියන ඉඩම ;
නැගෙණහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්.

(6) කොස්ගහවත්ත.—පර්චස් 5 ක් පමණ :
උතුරට සහ බස්නාහිරට : අළුත්පාර (රාජසන්තක) ;
නැගෙණහිරට සහ දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස්.

අංකය ජේ. 57 ටී 120

1957.10.16 වෙනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධික) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදී 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාත ආදයම් පාලක කොට්ඨාශයට අයත්, මාටඹුවා තුලාන ගම්මුලාදැනි වසමේ හොරුවිල ගමේ පිහිටි (අ.ග.සී.866 ලොට් අංක 11බී, 32 සහ 36) කහටගහ ඉඩම, මීගහ ඉඩම, සහ දඹගහඉඩම යන මේවායින් අක්කර 0, රූඩ් 3, පර්. 22.4 ක පමණවූ ප්‍රමාණය දැක්වෙන ඉඩම් කැබැලිවලට මායිම් මෙසේය :—

(1) දඹගහඉඩම.—අක්. 0. රූඩ්. 2. පර්. 3.6 පමණ :
නැගෙණහිරට සහ උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස. (ලොට් 11 බීඅ.ග.සී.886) ;
දකුණට : රජයේ ඉඩම් ;
බස්නාහිරට : හොරුවිල–අන්දිරියාගම මාවත.

(2) මීගහ ඉඩම.—අක්. 0. රූඩ්. 1 පර්. 2.0 පමණ :
උතුරට : රජයේ තහනම් බිම.—(ලොට් 31 අ.ග.සි. 866) ;
නැගෙනහිරට : හොරුවිල එච්. ඇම්. ජෝන්සිංඤො අයිතිවාසිකම් කියන ඉඩම ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස (ලොට් 32 අ.ග.සි.866) ;
දකුණට : රාජසන්තක ඉඩම්. (ලොට් 130 අ.ග.සි. 866).

(3) කහටගහඉඩම.—අක්. 0 රූඩ් 1 පර්. 16.8 :
උතුරට : හොරුවිල ගමේ පිහිටි පරණ කුඹුර (ලොට් 32 අ.ග.සි. 866) ;
නැගෙණහිරට : රජය සතු කැලය. (ලොට් 130 අ.ග.සි.866) ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස (අ.ග.සි.866ලොට් 36);
බස්නාහිරට : රාජ සන්තක ඉඩම් (අ.ග.සි.866 ලොට් 130).

අංක ජේ. 57/58 ඇල්.50.
1958.4.2. වෙනි දින
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය: ආර්/කිව් 222

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

උපලේඛනය

පිහිටීම : කොළඹ නාගරික සීමාවතුළ අංක 13 කොට්ඨාශය, කොටුව්

| ඉඩමේ නම | විස්තරය | අයිතිකරු | ප්‍රමාණය |
|---|---|---|---|
| කොළඹ, කොටුවේ, කුමාර වීථියේ නාගරික වරිපනම් අංක 21–25 දරණ ගොඩ නැගිලි | කොළඹ, සීමාසහිත, වයිට්එවේ ලෙඩ්ලෝ සහ සමාගමේ මහතුනට අයත් වෙළඳ ගොඩනැගිලි සහිත ඉඩම | සීමාසහිත වයිට්එවේ ලෙඩ්ලෝ සහ සමාගමේ මහතුන්, තැපැල් පෙට්ටිය අංක 170 , කොළඹ, ලංකාව | අ.0 රූ.1 පා. 02, පමණවේ. මැනුම්පති විසින් මූලික සැලැස් මවල් පිළියෙල කිරිම අවසන් වූවිට ඉඩමේ නියම විශාලත්වය තීරණය කරනු ඇත |

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 අගෝස්තු 14 වෙනි දින පෙරවරු 10ට කොළඹ, කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 අගෝස්තු 7 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ ජූලි මස 22 දින,
කොළඹ කච්චේරියේදිය.

යූ. ඒ. ගුණරත්න,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත අඥපණතින් සංශොධනය කරණ ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරණ ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශයේ " උඩුනුවර" ගහ පළාත කෝරලේ, මීවතුර සහ යාලේගොඩ ගම්වල පිහිටි ප්‍රමාණයෙන් අ. 13, රූ. 0, ප. 21ක්වූ ආතර්ගේ ඉඩම නොහොත් මිරිස්දෙනියේ වත්ත සහ මිරිස්දෙනියේ කුඹුර නමැති මූලික සිතියම් අංක ඒ. 2475හේ සහත සඳහන් පරිදි මැන විස්තර කර ඇති සම්පූර්ණ කොටස.

| කැබලි | ඉඩමේ නම | අයිතිවාසිකම් කියන අයගේ නම් | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | ආතර්ගේ ඉඩම නොහොත් මිරිස්දෙනියේවත්ත සහ මිරිස්දෙනියේ කුඹුර | ඒ. ඇල්. ක්‍රාස් අංක 29/1, ගාලු පාර, බම්බලපිටිය, ආර්. එච්. ඇම්. ජැන්ස්? මහත්මිය, 32 වෙනි මාවත, වැල්ලවත්ත, කොළඹ 6, ඩබ්ලිව්. ඇල්. මැන්ඩිස් මහත්මිය, F6 රත්මලාන වත්ත, රත්මලාන, සහ ජී. සෙබස්ටියම් පිල්ලේ, පේරාදෙනිය | 3 | 0 | 13 |
| 2 | ආතර්ගේ ඉඩම නොහොත් මිරිස්දෙනියෙවත්ත ... | ඒ. ඇල්. ක්‍රාස්, 29/1, ගාලු පාර, බම්බලපිටිය, ආර්. එච්. ඇම්. ජැන්ස් මහත්මිය, 32 වෙනි මාවත, වැල්ලවත්ත, කොළඹ 6, ඩබ්ලිව්. ඇල්. මැන්ඩිස් මහත්මිය, F6 රත්මලාන වත්ත, රත්මලාන, ජී. සෙබස්ටියම් පිල්ලේ, පේරාදෙනිය සහ කේ. ඩබ්ලිව්. කිරිබන්ඩා, වෙලේවත්ත, මීවතුර | 6 | 1 | 24 |
| 3 | එම් ... | ඒ. ඇල්. ක්‍රාස්, 29/1, ගාලු පාර, බම්බලපිටිය, ආර්. එච්. ඇම්. ජැන්ස් මහත්මිය, 32 වෙනි මාවත, වැල්ලවත්ත, කොළඹ 6, ඩබ්ලිව්. ඇල්. මැන්ඩිස් මහත්මිය, F6, රත්මලාන වත්ත, රත්මලාන, ජී. සෙබස්ටියම් පිල්ලේ, පේරාදෙනිය සහ ආර්. ජැන්ස් මහත්මිය යාලේගොඩ | 3 | 2 | 24 |
| | | එකතුව ... | 13 | 0 | 21 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 2 වෙනි දින පස්වරු 2.30 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 අගෝස්තු මස 26 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුන සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ ජූලි මස 18 දින,
මහනුවර කච්චේරියේදීය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

අංකය : ඇල්.ඞී/5009.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බටහිර පාලිස්පත්තු කෝරලේ, නාරන්පනාව ගමෙහි පිහිටි පාලුගෙදර කුඹුර නමැති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 01·75 ක්වූ අංක ඒ 2,507 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 1 යනුවෙන් මැන විස්තර කර ඇති, දැනට හදිසි මරණ පරීක්ෂක අබේරත්න බන්ඩා ඒකනායක, වේරපිටිය, මඩොල්කැලේ යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 4 වන දින පෙරවරු 10.00ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 අගෝස්තු මස 28 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලිය කියවිලිද මේ කරුණ සම්බන්ධ පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

වර්ෂ 1958ක්වූ ජූලි මස 19 දින,
මහනුවර කච්චේරියේදීය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලේනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

සඳහන් අංකය : 3/40/9.

## 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපණත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පැලැන : මූලික සිතියම් අංක ඒ 2,415. ගම—මහවෙල.

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය<br>අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මහලෙවකන්දවත්ත ... | පරණ රබර් සහ පොල් සහිත වත්ත, අඩිපාරකින් කොටසක්, පාරක් සහ කොටසක් කඩාවැටී ඇති ගාලක් සහිත පරණ රබර් වවා ඇති වත්ත | අකුරණ, ඇන්. එච්. මොහොමඩ්,<br>අ. රූ. ප.<br>රබර් ... 6 3 28<br>පාර ... 0 1 32<br>රබර් සහ පොල් 14 0 02 | |
| | | | එකතුව ... | 21 1 22 |

පැලැන : අවසාන ගම් සිතියම් අංක 64හි අතිරේක අංක 1. ගම—තැඹිලිදෙනිය

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය<br>අ. රූ. ප. |
|---|---|---|---|---|
| 35 | හපුගහමුලවත්ත ... | අවුරුදු 15ක්වූ කොකෝ ගස් 1 ක් ද අවුරුදු 3ක්වූ පොල් ගස් 3ක්ද සහිත අවුරුදු 30ට වැඩි පොල් ඇති වත්ත | ගාල්ලේ උඩුගම අප්පොප්වත්තේ, ඞී. මුණසිංහ | 0 0 04 |
| 36 | පන්සල්කඩවත්ත, ගෙදරවත්ත | අවුරුදු 4ක්වූ කිතුල් ගස් 6ක්ද, අවුරුදු 4ක්වූ දෙඩම් ගස් 1ක්ද, අවුරුදු 8ක්වූ අඹගස් 1ක්ද, අවුරුදු 25ක් වූ කොස් ගස් 1ක්ද, අවුරුදු 3ක්වූ පුවක් ගස් 4ක්ද, අවුරුදු 10ක්වූ පුවක් 47ක්ද, අවුරුදු 4ක්වූ පොල් ගස් 4ක්ද, අවුරුදු 30ක්වූ පොල් ගස් 21ක්ද ඇති අවුරුදු 30ට වැඩි පොල් ඇති වත්ත | මහවෙල කේ. ඞී. කරුණසියා ... | 0 1 16 |
| 37 | මහලෙවකන්දවත්ත ... | අඩිපාරක් සහ පාරක් ඇති පරණ රබර් වත්ත ... | අකුරණ ඇන්. එච්. මොහමඩ්<br>අ. රූ. ප.<br>රබර් ... 17 3 25<br>අඩිපාර ... 0 2 14 | 18 1 39 |
| | | | එකතුව ... | 18 3 19 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 අගෝස්තු මස 29 දින පෙ.ව. 9.30ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1958.8.22 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දන්වීමකින් මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

මාතලේ කච්චේරිය,
1958 ජූලි මස 14 දය.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

අංකය. ඇල්.ඩී./ඇල්ඊ 92

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැණීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

ඇන්/දෙහිපෙ පාසැල සඳහා

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ආදයම් පාලක නිලධාරි කොට්ඨාශයේ, කොහොක කෝරලේ බෝධිමල්කඩ ගමේ පිහිටි පහත සඳහන් ඉඩම් කට්ටි :—

ප්ලෑන් නො. පී. පී. ඒ2,506

| කට්ටි නො. | ඉඩමේ නම | | අයිතිවාසිකම් කියන අය | | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | බෝධිමල්කඩහේන | ... | එච්. ජී. උක්කුබණ්ඩා, දෙහිපෙ | ... | 0 3 03·0 |
| 2 | එම | ... | එච්. ජී. බිසෝමැනිකා, එච්. ජී. ලොකුබණ්ඩා සහ එච්. ජී. අබේමැනිකා, සියළුදෙන දෙහිපේ එච්. ජී. පුංචිරාලගේ සුළු උරුමක්කාරයෝය | ... | 0 0 37.2 |
| 3 | එම | ... | කේ. දිවාරත්න වාසල මුදියන්සෙලාගේ කරුණාරත්න, දෙහිපෙ | ... | 0 2 21·5 |
| | | | එකතුව | ... | 1 2 21·7 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958ක්වූ අගෝස්තු මස 25 වැනි දින පූ.භා. 10ට දෙහිපේ ගම්මුලාදෑනිතැනගේ නිවසේදී මා සම්මුඛ විය යුතුයි.

තවද අගෝස්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් මවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ ජූලි මස 16 දින,
නුවරඑළිය කච්චේරියේදීය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි තැන, නුවරඑළිය.

---

මෙ සම්බන්ධ සියලු ලියකියවිලිවල මේ අංකය සඳහන් කරන්න: ඇල්.සී./ඒ./8 ඒ.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතින් සංශෝධනය කරන ලද 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා, එනම් ගම් විශාල කිරීම සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත පණතින් සංශෝධනය කරන ලද 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් තමන්ගේ 1958. 1.22 දින අංක ජේ 57 ඇල් 487 (වීඊ) දරණ ප්‍රකාශනයෙන් තීරණය කර, 1958. 2. 7 දින අංක 11,255 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි:

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය : ගහබඩ පත්තුව ; ගම් මුලාදෑනි වසම.—ගනේගම නැගෙණහිර

ගම: ගනේගම දකුණ ; සැලැස්මේ අංකය : අංක ඒ. 1,681 දරණ මූලික සැලැස්ම

| කැබලි අංක | | ඉඩමේ නම | | විස්තර | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | ... | අඹනගලකන්ද නොහොත් අක්කරවිස්ස | ... | අවුරුදු 40ක් පමණවූ අත්හරින ලද තේ වගාව, ස්ථිර ගොඩනැගිල්ලක්, අඩි පාරක් සහ ගල් සහිත කොටස් දෙකක් තිබේ | 20 2 29 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 අගෝස්තු මස 30 වැනි දින පෙරවරු 10.00ට ගාල්ලේ කච්චේරියේදී මා හමුවිය යුතුයි.

තවද, 1958 අගෝස්තු 23වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් තමා විසින් හෝ ඔවුන්ගෙන් ලියකියවිලි වලින් බලයලත් අයවලුන් විසින් හෝ පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අයිතිවාසිකම් ස්ථිර කිරීමට අදල වන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේ මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අංක ඒ. 1,681 දරණ මූලික සැලැස්මේ පිටපතක් බද්දෙගම, ගනේගම නැගෙණහිර ගම් මුලාදෑනි කාර්‍යාලයේදී බැලීම සඳහා තැන්පත්කර ඇත.

1958 ජූලි මස 15 වැනි දින,
ගාල්ලේ දිසාපති කාර්‍යාලයේදීය.

ජේ. ඇස්. ප්‍රනාන්දු,
රජයට ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

යාපනය දිසාවේ වඩමරාඩ්චි ආ. පා. නි. තැනගේ ප්‍රදේශයේ පේද්‍රු තුඩුව සුළු නගර සභා සීමාව තුල දෙවන වට්ටාරමේ උසාවිය පාරේ වරිපනම් අංක 12 දරණ ' තිල්ලෙයිනින්රතෙනි ' නමැති ප්‍රමානයෙන් රූඩස් 1, පර්. 10·4 ක් පමණැති මුළු ඉඩම හෙවත් 9.6.58 වන දනම දරණ පිපිජ් 2,118 දරණ සිතියමේ පළමුවන ඉඩම් කොටස,

මෙකී ඉඩමට හිමිකම කියන්නේ, පේද්‍රු තුඩුවේ සිත්මිනගර් දේවාලය භාරකරුවූ මඩකලපුවේ ප්‍රා.කැ.නි. තැනගේ කායඝාලයේ එස්. කතිරගාමිතම්බි මහතා ය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ අගෝස්තු මස 29 වන දින පෙරවරු 10.30 වේලාවට පේද්‍රුතුඩුවේ තානායමේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958වේ අගෝස්තු මස 15 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

මේ සම්බන්ධ ලියුම් කියුම් වලදී ඇල් ඒ 1123 වන අංකය සඳහන් කරන්න.

ඒ. ටී. මූර්ති,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1958ක්වූ ජූලි මස 14 වැනි දින,
යාපනය කච්චේරියේදීය.

---

යොමු අංකය : ඇල්ඒ. 3609.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්ත සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,520 දරණ මූලික සැලැස්ම. ගම :: ආඩිමුනායි

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | වපසරිය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| (1) | ආඩිමුනායි තෝට්ටම් ... | පොල් අතු වලින් සෑදූ තාවකාලික පැල්පත් 13ක්ද, මුඩු බිමක් සහ දිය කඩිති වලින් යුත් අවුරුදු 40ක් පරණ පොල් වත්තක් | හලාවත, පාලම වීදියේ ඇල්. කදිර්ගාමන් පිල්ලෙයි, හලාවත ඇන්. සොක්කලිංගම්, බත්තුළුඔය; කිරියන්බාලියේ ඒ. කේ. සෙල්ලකාලිඅම්මා; උඩප්පුවේ ආඩිමුනායි ඇම්. නල්ලවයිරතා, ආර්. රාමචන්ද්‍රමූර්ති, ටී. තෙච්චනමූර්ති; උඩප්පුවේ ඇන්. පොන්නම්බලම්, මුත්තු කාමච්චි මහත්මිය, ඇම්. මුත්තුරාමන්, ඇන්. සෙල්ලිඅම්මා, කේ. මුත්තුකම්බි, ඇස්. තෙල්ලියම්පලම්, ඇස්. කාලමුත්තු, ඇස්. වයිරදපන්, ඇස්. වයිරයියා, ඇන්. අන්ඩියාදප්පන්, සහ ඇන්. වයිරනාදන් | 109 | 1 | 32 |
| (2) | ආඩිමුනායි තෝට්ටම් ... | පොල් අතු වලින් සෑදූ තාවකාලික පැල්පත් 20ක්ද, බැමි බඳින ලද ළිං 2ක්ද, මුඩු බිමක් සහ දිය කඩිති වලින් යුත් අවුරුදු 40ක් පරණ පොල් වත්තක් | උඩප්පුවේ ආඩිමුනායිහි ආර්. මුත්තුවයිරත්න, ආර්. නල්ලවියරතා, ඇම්. නල්ලවයිරතා, ඇම්. රාමචන්ද්‍රමූර්ති, ඇන්. තෙච්චනමූර්ති; උඩප්පුවේ ඒ. කේ. නෙච්චිමුත්තු, ඊ. මුත්තුකනාච්චි, ඊ. අයියාදුරෙයි, කේ. මරියායි, ඒ. පෙරුමලම්මාමුත්තු, ඒ. පෙරුමල් කමලච්චි, කේ. රකයායි, ඇස්. පුඩප්පන්, ඇස්. අන්නකුරානි, ඇස්. කමලමුත්තු, ඇස්. තයියනාකි, ඇන්. අන්ඩියප්පන්, ඇන්. සෙල්ලිඅම්මා සහ ඇන් වයිරවනාදන් | 55 | 0 | 32 |
| | | | එකතුව ... | 164 | 2 | 24 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් මස 15 වැනි දින පූ.භා. 10ට බත්තුළු ඔයේ සංචාරක බංගලාවේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 8 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූලි මස 15 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්ත තැන, පුත්තලම් දිස්ත්‍රික්කය,

---

යොමු අංකය : ඇල්ඒ. 3612.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි,

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අංක ඒ 1,512 දරණ මූලික සැලැස්ම. ගම : නැගෙනහිර කටුකෙන්ද

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම් පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| (1) | මාවත්ත වත්ත ... | පොල් අතු වලින් සෙවිලි කළ බඳින ලද බිත්ති සහිත ස්ථිර (ලයින්) කම්කරු නිවාස 3ක් සහ පොල් අතු සෙවිලි කළ මැටි බිත්ති සහිත (කුස්සි) තාවකාලික ගෙවල් 2ක්ද, බඳින ලද ළිඳක්ද, නොබඳින ලද ළිඳකින්ද යුත් අවුරුදු 40ක් පරණ පොල් සහිත ඉඩමක් | නුවරඑළියේ සීමාසහිත ලංකා තේ වැවිලි සමාගම | 24 2 22 |
| | | | එකතුව ... | 24 2 22 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් මස 17 වැනි දින පූ.භා. 11 ට පුත්තලමේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූලි මස 18 වැනි දින
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්තතැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

---

යොමු අංකය : ඇල්.ඒ. 3602.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ — 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,524 දරණ මූලික සැලැස්ම. ගම : නාවට්කාඩු සහ උප්පු දළුව

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම්පාන්නාගේ නම | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| (1) | කමක්කාරන් තෝට්ටම් ... | දිය කඩිත්තක් සහ පැතිරී ඇති පොල් ගස් කීපයක් සහිත සමතලා කැලෑවක් ද, බඳින ලද ළිඳක් සහ තාවකාලික ගෙයකින් යුත් අවුරුදු 40ක් පමණ පොල් වත්තක් | උතුරු ඉන්දියාවේ කරෙයික්කුඩුහි ඇස්. පී. ඇල්. සුබ්බයියා චෙට්ටියාර් | 26 1 6 |
| (2) | කමක්කාරන් තෝට්ටම් ... | පැතිරී ඇති පොල් ගස් කීපයක් ඇති සමතලා කැලෑවක්ද, විශාල දිය කඩිත්තක්ද, පොල් ගස් 9ක් සහිත අවුරුදු 40ක් පරණ පොල් වත්තක් | එම .... | 24 0 33 |
| | | | එකතුව .... | 50 1 39 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958වේ සැප්තැම්බර් මස 17 වැනි දින පූ.භා. 11ට පුත්තලමේ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ සැප්තැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ජූලි මස 19 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්තතැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

---

# ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

මගේ අංකය : ඇල්. ආර්. ඕ ජී.

දිසාපතිගේ අංකය : ඇල්. එච්/ඇල්. ආර්ඕ/52.

### දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ නිවේදනයයි

පහත විස්තර කර ඇති ආණ්ඩුවේ ඉඩම් සඳහා ඔප්පු නිකුත් කිරීම පිණිස පුද්ගලයින් තේරීම වස්, 1958. 9. 15 දින සඳුද පෙරවරු 10ට මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් මහනුවර කච්චේරියේදී, ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1948වේ ඉඩම් නිදහස් කිරීමේ නීති රීති සංග්‍රහයෙහි 3 වෙනි නීතියෙන් සහ 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස් කිරීමේ ආඥපනතේ අංක 5 (1) දරණ කොටසින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ පළමුවැනි ෂැඩ්‍යුලයේ කොන්දේසිවලට මෙම ඔප්පු යටත් වේ.

3. සෑම ඉල්ලුම්කරුවකු පුද්ගලිකව ඉඩම් කච්චේරියට පැමිණිය යුතුය. නැතහොත් ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිතයෙකු පෙනී සිටිය හැක.

4. ඉඩම් කච්චේරි පිළිබඳ විමසීම් මහනුවර ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.

1958 ජූලි මස 17 දින,
කොළඹදීය.

අ. ව. ල. අභයසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්.

ඉඩම් පිළිබඳ විස්තර

| ඉඩම් අධිකාරිගේ අංකය | ලොට් නො. | ඉල්ලුම් කරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| ඇල්ආර්ඔ/ඒපීඇල් 3710 | 1 සහ 2 | ඒ 1712 දරණ මූලික පිඹුර පාතදුම්බර කොට්ඨාශයේ හෙනගැහුවල මැදගම්මැද්ද ගම | |
| | | තෙල්දෙනියේ එළියවත්තේ ජේ. ඒ. ඩබ්ලිව්. සවරියප්පර් මහත්මයා ... | 22 3 35 |
| ඇල්ආර්ඔ/ඒපීඇල් 4681 | 1 | ඒ. 1895 දරණ මූලික පිඹුර. පාතදුම්බර කොට්ඨාශයේ උඩ ගම්පහ කෝරළේ හුරිකඩුව මැදිගේ උඩ ගම්මැද්ද ගම | |
| | | වත්තේගම හුරිකඩුවේ මැණික්හින්නේ ඇස්. එච්. පොඩිසිඤ්ඤෝ මහත්මයා | 5 0 37 |
| ඇල්ආර්ඔ/ඒපීඇල් 4856 | 2 | ඒ. 1893 දරණ මූලික පිඹුර. හාරිස්පත්තුව කොට්ඨාශයේ, කුළුගම්මන සියපත්තුවේ තිත්ත පජ්ජල ගම | |
| | | වැරැල්ලගම, තිත්ත පජ්ජල පී. ඊ. ඇම්. පුංචිබන්ඩා මහත්මයා ... | 0 3 26 |

---

## දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මාතර දිසාපති කායර්‍යාලයේ දී 1958 අගෝස්තු මස 25 වෙනි දින පූ.භා. 10.30ට 1935හේ අංක 19 දරණ ඉඩම් සංවර්ධන කිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඩබ්ලිව්. එස්. ද අල්විස්,<br>ඉඩම් කොමසාරිස් තැන වෙනුවට.

දීමට යන ඉඩමේ විස්තර

| ප්ලෑනේ අංකය හා ගම | කැබෙල්ලේ අංකය | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| අ.ග.සි. 10, වැලිව ... | 376 සහ 377 | ඊ. පී. විජේතුංග ... | 29 2 21 |
| අ.ග.සි. 10, වැලිව ... | 634 සහ 636 | ඩී. ඇස්. රත්නායක ... | 5 2 0 |
| අ.ග.සි. 26, බානගල | 402 | ජේ. අබේවික්‍රම ... | 9 3 23 |
| අ.ග.සි. 33, බෙරල පනාකර | 791 | ඩී. ඇල්. හතරසිංහ ... | 10 0 26 |
| අ.ග.සි. 33, බෙරල පනාකර | 799 | ඒ. ජයරත්න ... | 10 2 0 |
| අ.ග.සි. 86, තලහගම | 138 | වී. පී. අයි. ඇම්. ද සිල්වා ... | 10 0 33 |

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. කේ. 177.

### 1948 රජයේ ඉඩම් පණතේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියාවේ, "මිෂන් හවුස්" හි පදිංචි, ඒ. මයිල්වාගනම් මහතා, වවුනියාවේ නගර සීමාවතුළ පිහිටි, ප්‍රමාණයෙන් රූඩ් 2, පර්චස් 5ක් වූ 63 වැනි ගම් පිඹුරයේ අංක 104 දරණ බිම් කැබැල්ල, වාසය සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් දන්වා සිටිමි.

2. මෙම ඉඩම ඉල්ලුම්කරුට දැනට දී තිබෙන්නේ වාර්ෂික බලපත්‍ර යක් පිටය. මෙහි කුඩා ගෙයක්ද ළිඳක් ද ඇත. මෙම ඉඩම වාසය සඳහා වෙන් කරන ලද පෙදෙසක පිහිටුවා තිබෙන බැවින් ඉල්ලුම් කරුට බදු දිය හැක. තවදුරටත් බලපත්‍රයක් පිට බුක්තිය සවි නොවන බැවින්, රජයේ සම්මත කොන්දේසි වලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත්කොට, ඉල්ලුම්කරුට මෙම ඉඩම බදු දීමට අදහස් කරමි :—

(අ) කාලය : අවුරුදු 25යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 13යි. පස් අවුරුද්දකට වරක් සංශෝධනය කරනු ලැබේ ;

(උ) නිවාස හා නගර දියුණු කිරීමේ ආඥාපණතට අනුවද සැලැස්ම හා ආකෘති සඳහා මුලින් වවුනියාවේ රජයේ දිසාපති තුමාගේ අනුමතිය ලියවිල්ලකින් ලබාගෙන ඉල්ලුම්කරු බද්ද ලබා ගත් දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළත අඩු වශයෙන් රු. 2,500ක් වටිනා ගොඩනැගිල්ලක් ඉඩමේ තැනිය යුතුයි ;

(එ) බදුකරු නිවාසය සඳහා මිස වෙන කිසිම කටයුත්තක් සඳහා ඉඩම ප්‍රයෝජනයකට නොගත යුතුයි.

3. මෙහි පහත සඳහන් දිනයේ සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සැලකිය යුතු හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව ඉඩම බද්දට දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්.<br>ඉඩම් කොමසාරිස් වෙනුවට

1958 ජූලි 17 දින,<br>කොළඹදීය.

ඇල්. ජේ. 1534/ඇල්. ඇම්.

### 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ යගම්පත්තු කෝරලේ පහල කඩිගොමුවේ 2144 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 81 දරණ අක්කර 2, පර්චස් 3 ක් පමණැති ආණ්ඩුවේ ඉඩම් කට්ටිය පාසැලක් සෑදීම පිණිස ලංකා බෞද්ධායතනයේ පාඨශාලා සාමාන්‍යාධිකාරී තැන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. ඉල්ලුම්කර ඇති ඉඩම අවශ්‍ය කාරණයට දීමට තිබේ. එසේම ඉල්ලීම පරිදි රජයේ සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට යෝජනා කර ඇත :—

(අ) බද්ද : අවුරුද්දකට රු. 14 යි ;

(ඉ) කාලය : අවුරුදු 30 යි ;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ අවුරුදු දෙකක් ඇතුළත මෙම ඉඩමෙහි කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්තගේ සිත් ගන්නා පරිද්දෙන් පාසැල් ගොඩනැගිල්ලක්, ගුරු නිවාසයක් හා වැසිකිළියක් සෑදිය යුතුයි ;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම් ඉහත සඳහන් කාරණය සඳහා විනා අන්‍ය කටයුත්තකට නොයෙදිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,<br>ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ජූලි 25 වෙනි දින,<br>කොළඹ දී ය.

3. මෙම ඉල්ලුම් පත් එවන විට 'දිසාපති තුමා, අනුරාධපුරය' කියා එවිය යුතුයි. තවද එම ඉල්ලුම් පත් වෂී 1958 වේ අගෝස්තු මස 14 දින උදේ 10 ට හෝ ඊට ප්‍රථම එතුමාට ලැබෙන්ට සැලැස්විය යුතුය. සෑම ඉල්ලුම් පතකම වෙනත් කරුණු අතර පහත සඳහන් විස්තර අඩංගු විය යුතුයි.

**එකී විස්තර :—**

(අ) රජයට ගනු ලැබූ හෝ ගැනීමට අදහස් කර ඇති ඉල්ලුම්කරු සතුවූ හෝ පදිංචිවූ වෙළඳාම සඳහා යෙදුවාවූ ඉඩම් වල හෝ අන් ඉඩම් වල සම්පූර්ණ විස්තර.

(ආ) ඉල්ලුම්කරු බදුගැනීමට අදහස් කරන ඉඩමේ ප්‍රමාණය.

තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුම වෙනත් කරුණුවලට අමතරව පහත සඳහන් කොන්දේසි වලට යටත් බද්දකට ඇතුළත් වීමට අවශ්‍ය වේ :—

(අ) බද්ද දෙනු ලබන්නේ අවුරුදු 99 කටය.

(ආ) බදුකරු ඉඩම වෙනුවෙන් එහි මුඩු බිමේ වටිනාකමෙන් සියයට හතර ගණනේ ගණන් බැලූ වාර්ෂික බදු මුදලක් ගෙවිය යුතුය.

(ඉ) බදු කරු වෂී දෙකක් ඇතුළතදී තමාගේම වියදමින් රජයේ නගර නිර්මාණ ශිල්පියා විසින් පළමුව අනුමත කරන ලද සැලැස්මකට අනුව මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් සද නිම කළ යුතුය.

(ඊ) බදුකරු බද්ද ගත් දින සිට අවුරුද්දක් ඇතුළතදී ගොඩනැගිල්ල සෑදීමට පටන් ගත යුතුයි.

(උ) බදුකරු ඉඩම වෙළඳාම සඳහා හැර අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදිය යුතුය.

5. බදුකරුවන් තෝරීමේ ඉඩම් කච්චේරිය වෂී 1958වේ අගෝස්තු මස 21 දින, උදේ 10 ට අනුරාධපුර කච්චේරියේදී පවත්වනු ලැබේ. සෑම ඉල්ලුම්කරුවෙක්ම හෝ තමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද කෙනෙක් හෝ මෙකී ඉඩම් කච්චේරියේදී පෙනී සිටිය යුතුය.

ඉඩම් පිහිටි ස්ථාන හෝ මේ පිළිබඳ වෙනත් විස්තර දිසාපති තුමාගෙන් දැනගත හැක.

ඩී. සී. ඇල් අමරසිංහ.
අ. දි. දිසාපතිතුමා

කච්චේරිය,
අනුරාධපුරය.
1958.7.12.

---

ඇල්. ඇස්. 3629 (ඇල්. කේ)

## 1948 රජයේ ඉඩම් පණතේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

සීමාසහිත "ඊස්ටර්න් ප්‍රොඩියස් ඇන්ඩ් එස්ටේට්ස්" සමාගම බදුල්ල දිස්ත්‍රික්කයේ, බුත්තල කොට්ඨාශයේ, කඳුකර කෝරළයේ, දිග්ගලරඹෙ පිහිටි, අංක 256 දරණ අවසාන ගම් පිඹුරේ අංක 153, 153½, 153 1/3 සහ 154 යන ප්‍රමාණයෙන් අක්කර 11ක් පමණ ඇති බිම් කැබලි, රබර් වගා කිරීම සඳහා බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බැව් මහජනයාට මෙයින් දන්වමි. මෙම ඉඩම අවුරුදු 50 ක බද්දකට දී තිබී එය අවසන් වූයේ 1955 නොවැම්බර් 27 දිනයේ ය.

2. මේ සඳහා මේ ඉඩම දිය හැක. රජයේ අනෙකුත් කොන්දේසි වලට ද අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට මේ බද්ද දීමට අදහස් කරනු ලැබේ :—

(අ) කාලය : 1956 නොවැම්බර් 28 සිට 30 අවුරුද්දක් ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 60 යි.

3. ඉඩම කලින් සමාගමට බදු දී එහි රබර් වගා කර තිබේ. වගාවට අවුරුදු 40 ක් පමණ වේ. අවුරුද්දකට පමණ පෙර කොටසක රබර් නැවත වගාකර තිබේ. දැන් ඉල්ලා ඇති ඉල්ලීම, 1955 නොවැම්බර් මස 27 වෙනි දින අවසන් වූ බද්ද අළුත් කරන ලෙසයි.

4. මෙහි සඳහන් දිනයේ සිට සති හයක් ඇතුළත බද්ද නොදිය යුතු බවට සැහෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව මේ බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව් . ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ජූලි මස 17 වැනි දින,
කොළඹදී ය.

---

අංකය : ඇල්. ජේ. 1299.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වැල්ලම්පිටියේ පරන පාරේ අංක 3/2 දරණ ස්ථානයෙහි පිහිටුවා ඇති, "මුනි සිරිපා වන්දන ජනෝපකාර සමිතියේ" භාරකාරයන් වන, සිරිල් වික්‍රමකාරඑආරච්චි, එච්. ධම්දස, ශූ. ශූ. පොඩි අප්පුහාමි, ඇම්. ආර්. ප්‍රනාන්දු, ඇල්. සී. ප්‍රනාන්දු සහ ආර්. ඒ. ඒමිස් සිංඤෝ යන මොවුන්, දාන ශාලාවක් සෑදීම සඳහා, රත්නපුර දිස්ත්‍රික්කයේ, ශ්‍රී පාදස්ථානයට යන මාගීයේ පිහිටි, අංක 2 දරණ අවසාන ටෝපෝ සිතියමේ දක්වෙන, කොටස් නොකරන ලද බිම් කැබැල්ලෙන් බදු යෙන් දිග අඩි 60 ක හා පළල අඩි 20 ක බිම් කැබැල්ලක් බදු ඉල්ලා ඇති බැව් මහජනයාට මෙයින් දැනුම් දෙමි.

2. ඉල්ලන ඉඩම මේ සඳහා දීමට තිබේ. එසේම ඉල්ලීම පරිදි ආණ්ඩුවේ සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට අදහස් කර ඇත :—

(ආ) කාලය : අවුරුදු 99 යි ;

(ඉ) බද්දම අවුරුද්දකට සත 50 යි ;

(උ) බදුකාරයින් විසින් බද්ද ආරම්භ වූ දිනයේ සිට අවුරුදු දෙකක් ඇතුළත දී මෙම ඉඩමේ ඉහත සඳහන් දාන ශාලාව රත්නපුරේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් ඉදිකරවිය යුතුයි ;

(එ) බදුකාරයින් විසින් මේ ඉඩම ඉහත සඳහන් කාරණය සඳහා විනා අන්කිසි කාරණයක් සඳහා පාවිච්චි නොකළ යුතුයි.

3. මෙහි සඳහන් දින පටන් සති 6 ක් ඇතුළතදී ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නො කළහොත්, ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ජූලි මස 18 වැනි දින.
කොළඹ දී ය.

---

ඇල්. ජේ. 1042

## නිවැරදි කිරීම

1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) දරණ රෙගුලාසිය යටතේ, 1958 මැයි 23 වෙනි දින අංක 11,318 දරණ රජයේ ගැසට් පත්‍රයේ 3 වෙනි කොටසෙහි ප්‍රසිද්ධ කරන ලද අංක ඇල්. ජේ. 1042 දරණ නිවේදනයෙහි 1 වෙනි පේලියෙහි වූ "කිරියායේ" වෙනුවට 'තිරියායි' කියාද "ගිරිහළු" වෙනුවට 'ගිරිහඩු' කියාද 2 වෙනි පේලියෙහි වූ "ගුරුසිංහ" වෙනුවට 'ගුණසිංහ' කියාද, 4 වෙනි පේලියෙහි වූ "හඩ්ඩුකුලම්" වෙනුවට 'කඩ්ඩුකුලම්' කියාද කියවිය යුතුයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ජූලි මස 16 වෙනිදා,
කොළඹදීය.

---

## විශෙෂ නිවේදනයයි

**1958 ජූලි 29 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 අගෝස්තු 1 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන 1958 ජූලි 28වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1958 ජූලි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.